සාකච්ඡා කර සකස් කළේ
ශ්‍රී ලංකාවේ ප්‍රවෘත්ති හා ජනමාධ්‍ය අමාත්‍යාංශයේ හිටපු ජ්‍යෙෂ්ඨ සහකාර ලේකම්
ශ්‍රියානි මද්දුමගේ

ශ්‍රී ලංකාවේ ආර්ථික වර්ධනය, රැකියා උත්පාදනය සහ විදේශ රැකියා අවස්ථා වැඩි දියුණු කිරීම වැනි අප රටට විශාල වශයෙන් ප්‍රයෝජනවත් වන අංශ වල වර්ධනයක් ඇති කර ගැනීම සඳහා සම්පත් බහුල රටක් වන ඔස්ට්‍රේලියාවෙන් ගත හැකි දායකත්වය අති මහත් ය. ලංකාව නියේජනය කිරීමේ මලතල ඇති පුද්ගලයෙකුට ඒ සඳහා අවශ්‍ය වන්නේ එම අංශ පිළිබඳ මනා අවබෝධයක්, දැඩි දැනුම්මතින් යුතුව ක්‍රියාත්මක වීමත් පමණි. මෑතකදී ඔස්ට්‍රේලියාවේ ශ්‍රී ලංකා මහ කොමසාරිස් තනතුර බාරගත් කුසුම්සිරි බාලපටබැඳි මහතා ශ්‍රී ලංකාවේ රාජ්‍ය සේවයේ ඉහළම තනතුර වසර 9 ක් පුරා හොඳවමින් සුවිශාල අත්දැකීම් සම්භාරයක් රැස්කරගත් අති දක්ෂ නිලධාරියෙකි. සිය ධුරය බාරගත් මොහොතේ සිටම ක්‍රියාකාරීව සිටින බාලපටබැඳි මහතා සංවාදයකට එක්කර ගන්නට සන්නසට හැකි විය. මේ ඒ සංවාදයයි.

ඔබ මහකොමසාරිස් තනතුරට පත් වූ දා සිටම ඔස්ට්‍රේලියානු රජයේ වගකිවයුත්තන් සමඟ විවිධ ක්ෂේත්‍රයන්ට අදාල සාකච්ඡා පවත්වා තිබෙන බව අපි දන්නවා.. මේ දෙරට අතර අන්තර්ජාතික සබඳතා වර්ධනය කරගැනීම අපේ රටට වැදගත් වන්නේ කොහොමද?

අප රටට යම් යම් අංශ වලින් සමාන කම් දක්වන දියුණු රටක් සමග සම්බන්ධතා පැවැත්වීමෙන් අපට ලැබෙන වාසි රැසක් තිබෙනවා. ඔස්ට්‍රේලියාවත් ශ්‍රී ලංකාව වැනි ම විවිධ ජාතීන් සහයෝගයෙන් ජීවත් වන රටක්. අප දෙරටේම තියෙන්නෙ ප්‍රජාතන්ත්‍රවාදී ආණ්ඩු ක්‍රමයක්. අනෙක් අතින් ඔස්ට්‍රේලියාවේ ශ්‍රී ලාංකිකයන් විශාල පිරිසක් ජීවත් වෙනවා. 1950 පමණ සිට මේ දක්වා විවිධ හේතූන් නිසා ශ්‍රී ලාංකිකයන් මෙරටට සංක්‍රමණය වෙලා තියෙනවා. 50 දශකයේදී රැකියා සඳහාත් ඉන්පසුව බර්ගර් ජාතිකයනුත් අනතුරුව අධ්‍යාපනය සඳහාත් මේ සංක්‍රමණය සිදුවුණා. ලංකාවේ පවතින යුද්ධය නිසා දමිළ ජාතිකයින් සංක්‍රමණය වීමත් ඉන්පසුව රටේ විප්ලවීය අරගල නිසා එයින් පීඩා ලත් අය සංක්‍රමණය වීමත් දකින්න පුලුවන්. වර්තමානයේ අපට පෙනෙන්නෙ අධ්‍යාපනය සඳහාත් රැකියා සඳහාත් වන සංක්‍රමණයක්. මේ වන විට ඔස්ට්‍රේලියාවේ ශ්‍රී ලාංකිකයින් ලක්ෂයකට වඩා ජීවත් වෙනවා.

වර්තමානයේ ඔස්ට්‍රේලියාවේ අධ්‍යාපනය ලබන ශ්‍රී ලාංකිකන් සංඛ්‍යාව 2800 ක් පමණ වෙනවා. මෙම ශ්‍රී ලාංකිකයන් මේ රටේ ආර්ථිකයට එලදායී ලෙස දායක වෙමින් අපේ මව්බිමට ද සේවයක් කරමින් මෙහි ජීවත් වන බව සඳහන් කළ යුතුයි. මෙවන් පසුබිමක් යටතේ අප දෙරට අතර සම්බන්ධතා තර කර ගැනීම අප රටටත් මෙහි ජීවත් වන ශ්‍රී ලාංකිකයනටත් වැදගත් බව අමුතුවෙන් කිය යුතු නැහැ.

ඒ වගේම දැනට අපේ රටේ පවතින්නේ අපට අවාසිදායක අපනයන රටාවක්. ඔස්ට්‍රේලියාව හා සසඳන කළ අපේ රටට තියෙන්නේ ඉතා සීමිත සම්පත් ප්‍රමාණයක්. අපේ රටේ සම්පත් වලින් ප්‍රයෝජන ලබාගෙන රටේ ආර්ථික වර්ධනය, විරැකියාව වැනි ගැටලු වලට විසඳුම් සෙවීමට ඔස්ට්‍රේලියාවෙන් ගත හැකි ප්‍රයෝජන බොහොමයි. එබඳු උදව් අපට ලබා ගැනීමට නම් එබඳු ඉඩ ප්‍රස්ථා පිළිබඳව සොයා බැලීමත් පැහැදිලි අරමුණු සහ සැළසුම් ඔස්ස් ක්‍රියාත්මක වීමත් අවශ්‍ය යි. මා මේ තනතුර දරන කාලය තුළ හැකිතාක් දුරට මේ කාර්යයන් ඉටු කිරීමට අදිටන් කරගෙන සිටිනවා.

ඔබේ ධුර කාලය තුළ දී දෙරට අතර ආනයන හා අපනයන අංශය දියුණු කිරීම සඳහා ඔබේ සැළසුම් මොනවා දා?

අපේ රටේ පවතින සමාජ, ආර්ථික ගැටලු වලට අමතරව මෑතකදී සිදුවූ සුනාමි වසනය හේතුවෙන් ආර්ථිකයට විශාල බලපෑමක් ඇතිවුණා. මෙවැනි තත්වයක් යටතේ ලංකාවෙන් ඔස්ට්‍රේලියාවට අපනයන කටයුතු වල වර්ධනයක් ඇති කිරීමට හැකි වුව හොත් එය ලංකාවට විශාල සේවයක් වෙනවා. අපේ අපනයන වෙළඳාම වැඩි දියුණු කිරීමේ සැළසුම්මක් දැනටමත් මම සකස් කරලා තියෙනවාත එය ක්‍රියාත්මක කිරීමේ මූලික කටයුතු දැන් අරඹා තිබෙනවා. 2005 මැයි 4 වන දා මහ කොමසාරිස් තනතුරේ වැඩ බාරගැනීමෙන් පසුව මා ප්‍රමුඛස්ථානය දී කටයුතු කළේ අපනයන අංශයටයි. අප රටෙන් මේ රටට අපනයනය කරන භාණ්ඩ වර්ග හා ප්‍රමාණය ඉතාම සීමිතයි. අපේ සමහර අපනයන භාණ්ඩ වෙනත් රටවල භාණ්ඩ හා තරගකාරී මට්ටමක නොපැවතීමත් එක් අවාසියක්. මේ නිසා අපේ භාණ්ඩ වලට බදු ද එක් වූ විට ඒවා පහසුවෙන් ම තරගයෙන්

4 වන පිටට